---

## අකුරැස්ස ප්‍රාදේශීය සභාව.

## මාතර දිස්ත්‍රික්කය.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 28 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 ජුලි 06 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 09 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 පළාත් පාලන ක්‍රීඩා උළෙල වෙනුවෙන් 2011 නොවැම්බර් 28 දින රු.20,000 ක අත්තිකාරම් මුදලක් ප්‍රජා සංවර්ධන නිලධාරිණිය විසින් ලබාගෙන ඇතත් එකී මුදල සමාලෝචිත වර්ෂය අවසානයට පියවා නොතිබූ අතර ලැබිය යුතු ශේෂයක් ලෙසට ගිණුම් තැබීමද සිදුව නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර ණයගැතියන්ගේ වටිනාකම රු.23,314,279 ක් වුවද, ජර්නල් සටහන් අංක 32 මගින් රු.18,222,775 ක මුදලක් පමණක් ගිණුම්ගත කර තිබුණෙන් අඩුවෙන් දක්වා තිබූ මුදල රු.5,091,504 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.9,018,794 ක් වූ කර්මාන්ත ණයහිමියන්ගේ වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ආදායම් වියදම් ගිණුමට වියදම සටහන් කිරීමේදී, ඉකුත් වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී පියවන ලද ණයහිමියන් වෙනුවෙන් නැවත වතාවක් ප්‍රතිපාදන සලසා තිබුණෙන් සමාලෝචිත වර්ෂයේ වියදම රු.16,717,625 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) මුලධන ආධාර, ප්‍රධාන ලෙජරයට අනුව රු.34,656,778 ක් වූ අතර, ආදායම් වියදම් ගිණුමෙහි එකී ලැබීම රු.37,981,873 ක් ලෙස දක්වා තිබුණෙන් වැඩියෙන් දක්වා තිබූ මුදල රු.3,325,095 ක විය.

(ඊ) රු.760,510 ක් වූ අතුරලිය ප්‍රාදේශීය සභා ණය ගිණුම දිගු කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2012 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබුණු ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂයන්හි එකතුව පිළිවෙලින් රු.1,000 ක් හා රු.15,181,943 ක් විය.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.44,162,855 ක් කවූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,570,625 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 4,421,145 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ අදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | වරිපනම් හා බදු | 3,081 | 3,087 | 1,640 |
| (ii) | බදු කුලී | 3,920 | 4,567 | 3,240 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 881 | 875 | නැත |
| (iv) | වෙනත් ආදායම් | 8,547 | 8,926 | 24,766 |

2.2.2 වරිපනම් බදු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව අයවිය යුතු රු.1,007,610 ක වරිපනම් බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු සඳහා රු,2,342,598 ක බිල් කිරීම් කර තිබුණද වර්ෂය තුල අයකර තිබුණු මුදල රු.1,727,549 ක් පමණි. එමෙන්ම 2012 ජනවාරි 01 දිනට හිඟ රු.1,053,456 ක් වූ හිඟ මුදලින් සමාලෝචිත වර්ෂය තුල අයකර ගත හැකිව තිබුණු මුදල රු. 470,621 ක් පමණි. ඒ අනුව වරිපනම් බදු අයවීමේ ප්‍රගතිය පිළිවෙලින් සියයට 74 හා සියයට 45 ක් විය.

### 2.2.3 බිම්බදු ගාස්තු

බිම්බදු ගිවිසුම් පත්‍රයට අනුව වාර්ෂික බිම්බදු මුදල වර්ෂය තුලදී කොටස් 12 කින් හෝ එකවර ගෙවිය යුතු වුවත්, කඩ කාමර 31 කින් 2012 දෙසැම්බර් 31 දිනට රු.533,227 ක මුදලක් අයවී නොතිබුණි.

### 2.2.4 කඩකාමර කුලී

සමාලෝචිත වර්ෂය අවසානයට අකුරැස්ස පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 56 කින් රු.4,559,622 ක එක්වන් මුදල් අයවී නොතිබුණු අතර බදු ගිවිසුම් කොන්දේසි අංක 04 පරිදි මාසික කුලී නොගෙවන ලද කඩ කාමර 111 කින් රු.672,921 ක මුදලක් අයවිය යුතුව තිබුණි. බදු ගිවිසුම් පරිදි බදු කාලය දීර්ඝ නොකළ කඩ කාමර ගණන 24 ක් විය.

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබ මුදල් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| (i) | උසාවි දඩ | රු. 447,068 |
| (ii) | මුද්දර ගාස්තු | රු. 5,880,047 |

### 2.3 අවිධිමත් ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජංගම දුරකථන බිල්පත් ගෙවීම්

දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2009 අප්‍රේල් 23 දිනැති අංක දපපා/ආ/05/6/පොදු ලිපිය මගින් සභාපතිවරුන්ට මසකට රු. 2,000 ක මුදලක්ද, 2009 සැප්තැම්බර් 02 දිනැති අංක දපපා/පරිනි/03/09 ලිපිය මගින් උපසභාපතිවරුන්ට මසකට රු.1,500 ක මුදලක් සභා අරමුදලින් වියදම් දැරීමට අනුමැතිය ලැබී **තිබුණ ද** සභාපතිවරයාගේ සහ උප සභාපතිවරයාගේ ජංගම දුරකථනයන් වෙනුවෙන් එකී සීමාවන් ඉක්මවා 2011 අගෝස්තු සිට 2012 ඔක්තෝබර් දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා දුරකථන බිල්පත් පියවීම වෙනුවෙන් රු.33,064 ක මුදලක් සභා අරමුදලෙන් වැයකර තිබුණි.

(ආ) ගමන් වියදම් ගෙවීම්

දිනය, වේලාව, ගමන් කල ස්ථානය, පවරන ලද කාර්යයද දක්වමින් නියමිත ආකෘතියේ විධිමත් ගෙවීම් වවුචරයක් මගින් ගමන් වියදම් ගෙවිය යුතු වුවද 2012 වර්ෂයට සභාවේ සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන් 11 දෙනෙකු සඳහා රු.351,000 ක් වටිනා ගමන් වියදම් මාසික සභික දීමනාවට එකතු කර ගෙවා තිබුණි.

2.4 බැකෝ යන්ත්‍රය සේවයේ යෙදවීම

2010 ජලි 08 දින සභාව විසින් ජේ.සී.බී. බැකෝ යන්ත්‍රයක් රු.9,500,000 ක් ගෙවා පුද්ගලික සමාගමකින් මිළදී ගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(i) යන්ත්‍රය සේවයේ යෙදවීම සම්බන්ධයෙන් විධිමත් වාර්තා පවත්වා නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ බැකෝ යන්ත්‍රය යෙදවූ කාර්යයන් 39 ක් වෙනුවෙන් අයකරගත යුතු රු.1,278,640 ක මුදල අයකර ගෙන නොතිබුණි.

(iii) සභාවේ 2010 ජුනි 30 දිනැති මහා සභා තීරණයට පටහැනිව රියදුරන් තිදෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 96,971 ක්ද රිය සහායක සඳහා රු. 20,062 ක මුදලක්ද වැඩිපුර ගෙවා තිබුණි.

(iv) මෙම යන්ත්‍රය මිළදී ගැනීම සඳහා පිළියෙල කරන ලද ව්‍යාපෘති වාර්තාව අනුව අරමුණ 9 ක් ඉටුකර ගැනීම යටතේ වාර්ෂිකව රු.485,809 ක මෙහෙයුම් ලාභයක් ලැබීමට ඉලක්ක කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ මෙම යන්ත්‍රය සඳහා රු.3,101,944 ක් වැයකර තිබුණද ආදායම හා වියදම සම්බන්ධ ප්‍රමාණවත් වාර්තා පවත්වා නොතිබුණෙන් යන්ත්‍රයෙන් නිශ්චිතව මෙහෙයුම් ප්‍රතිඵල ගණනය කළ නොහැකි විය.

2.5 කොන්ත්‍රාත් පරිපාලනය

මලිදුව, බංගම කොරටුවවත්ත, පඹවැල්ල පාලම සංවර්ධනය කිරීම සඳහා දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2012 මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ පාලම දෙපස මාර්ගයට පස් යෙදීමට රු.100,000 ක මුදලක්ද, 2013 සභාවේ ප්‍රතිපාදන යටතේ රු.391,618 ක්ද වැය කිරීමට අදාල ලිපිගොනු පමණක් කාර්යාලයේ තිබූ අතර ඉකුත් කාලපරිච්ඡේදයන්ට අදාලව කරන ලද ඉදිකිරීම් වලට අදාල ලිපිගොනු වාර්තා ඉදිරිපත් කිරීමට වගකිවයුතු නිලධාරීන් අපොහොසත් විය.

සභාව ඉහත සඳහන් කාර්යයන් සඳහා මුදල් ගෙවා තිබුණද ඉකුත් වර්ෂයන්හි ඉටුකළ වැඩ කොටස්වල පහත සඳහන් ආකාරයේ අඩුපාඩු 2013 මැයි 15 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේද නිරීක්ෂණය විය.

- පාලමේ දික් අතට යොදා තිබූ කොන්ක්‍රීට් බිම් පහළට නැමී ඇදවී තිබුණි.
- පාලමේ මැද කොටසේ ෂටරින් ගැසූ කොටස් ගලවා ඉවත්කර නොතිබූ අතර මේ හේතුවෙන් එම කොටස් වල මතුපිට තත්ත්වය පරීක්ෂා කිරීමට නොහැකි විය.
- පාලමේ දික් අතට යොදා තිබූ කොන්ක්‍රීට් බිම් වල බොහෝ ස්ථාන සිදුරු සහිත වූ අතර මතුපිට සිනිඳු මතුපිටක් රහිත ගල් හා කම්බි මතුවී තිබෙනු දක්නට ලැබුණි. මෙවැනි අවස්ථාවක ICTAD පිරිවිතර SCA/4 වගන්ති 5.4.71 (a) ප්‍රකාර එම වැඩ කොටස් පිරිවිතරට අනුකූල නොවන අසතුටුදායක වැඩ කොටසක් ලෙස සලකා කඩා ඉවත් කරන ලෙසට කොන්ත්‍රාත්කරු වෙත දැන්විය යුතු වුවද එය සිදුව නොතිබුණි.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

2.6.1 දීර්ඝ කාලයක සිට අක්‍රියව පැවති අංක 223 දරන විදුලි ගිණුමේ රු.61,882 ක් වූ මුදල් ශේෂය පිළිබඳව කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවීය.

2.6.2 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව සභාව සතු පරිගණක 08 ක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි.

2.6.3 සමාලෝචිත වර්ෂය තුල රු.2,701,375 ක් වටිනාකමින් යුත් ව්‍යාපෘති 06 ක් සම්බන්ධයෙන් ගිවිසුම් අත්සන් කර ඇතත් වර්ෂය අවසාන දින දක්වා එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

2.6.4 2012 මග නැගුම ව්‍යාපෘති යටතේ රු.1,500,000 ක් වටිනාකමින් යුත් ව්‍යාපෘති 03 සම්බන්ධයෙන් කටයුතු නොකිරීම හේතුවෙන් එම ව්‍යාපෘති අවලංගු වී තිබුණි.

2.6.5 සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්ය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා ලෙස රු.14,106,750 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර, වර්ෂයේ වැටුප් වියදම රු.20,098,624 ක් වූයෙන් සභා අරමුදලට රු. 5,991,874 ක අතිරේක වැය බරක් වී තිබුණි.

2.6.6 2002 ජනවාරි 03 හා 2006 අප්‍රේල් 10 උනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14 හා අංක 28 මගින් පළාත් පාලන ආයතනවල අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් සේවකයින් බඳවාගැනීම අත්හිටුවා ඇතත් එකී විධිවිධාන වලට පටහැනිව සේවකයින් 09 දෙනෙකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් වශයෙන් සභා අරමුදලින් රු. 1,063,728 ක මුදලක් ගෙවා තිබුණි. මෙම චක්‍රලේඛ උපදෙස් අභිබවා යමින් බඳවා ගැනීම් සිදුකළහොත් ආයතන ප්‍රධානියා ඒ සඳහා පුද්ගලිකව වගකීමෙන් බැඳී සිටින බවද අවධාරණය කර තිබුණි.

2.6.7 රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2010 මාර්තු 10 දිනැති අංක PF/R/2/2/3/5(4) දරන ලිපිය පරිදි සභාවේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර සංයුක්ත සැලැස්මේ ඇතුලත් කාර්යයන් ඉටුකර ගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් ද සමාලෝචිත වර්ෂයට පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

2.7 අභ්‍යන්තර විගණනය

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය